# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/134/2022 (PSC)

ටී.පී.රාජපක්ෂ,

අභියාචක

එදිරිව

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

වගඋත්තරකරු

දිනය :- **2025.05.21**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් නීතිඥ පි.අබේවික්‍රම මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් පවනි රශ්මිකා මිය.

**විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා.**

## -නියෝගය-

අභියාචක වෛද්‍ය නිලධාරී ටී.පී.රාජපක්ෂ යන අය විසින් **2022.10.25** දාතමින් යුක්තව මෙම විනිශ්චය අධිකාරය වෙත **2022.11.10** වෙනි දින ඉදිරිපත් කරන ලද අභියාචනා පෙත්සමේ ඉල්ලා ඇත්තේ, විනය දඬුවමක් ලෙස ඔහු වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවන ලද වැටුප් වර්ධක අහිමි කරමින් දී ඇති තීරණය ඉවත් කර, ඔහුට විරුද්ධව ඉදිරිපත් කර ඇති අදාළ චෝදනාවන්ගෙන් ඔහු නිදොස් කර නිදහස් කර දෙන ලෙසයි.

ඉහත කී වැටුප් වර්ධක අහිමි කිරීම සඳහා පදනම් වී ඇත්තේ, **2018.08.13** දිනැති ව ඔහුට විරුද්ධව ඉදිරිපත් කර තිබූ චෝදනා හතරකින් යුක්ත චෝදනා වලින් චෝදනා **03**කට අභියාචක වරදකරු බවට පත්කර තිබිමයි. විනය පරීක්ෂණය පවත්වන ලද පරීක්ෂණ නිලධාරියා විසින් අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා හතරෙන් තුනකට අභියාචක වැරදිකරු කරමින් වූ තීරණය, ඔහු විසින් ඉදිරිපත් කර ඇති

වාර්තාව මගින් ප්‍රකාශයට පත්කර ඇත. එම වාර්තාව අත්සන් තැබූ දිනයක් සඳහන් නොවේ. කෙසේ වෙතත් විනය පරීක්ෂණය ආරම්භ කළ දිනය 2019.06.07 වන අතර, එය අවසන් කළ දිනය 2019.12.19 වෙනි දින ලෙසට වාර්තාව ආරම්භයේ සඳහන් කර ඇත.

ඉහත සඳහන් කර ඇති පරිදි එකී චෝදනා අතරින් චෝදනා තුනකට අභියාචක වරදකරු වීම හේතුවෙන්, 2021.10.21 දිනැතිව විනය නියෝගය නිකුත් කරමින් අභියාචකගේ වැටුප් වර්ධක දෙකක් විලම්භනය කිරීමට තීරණය කර ඇත. එකී නියෝගයට එරෙහිව අභියාචක විසින් ඉදිරිපත් කරන ලද අභියාචනය සළකා බැලූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉහතකී දඬුවම වෙනස් කරමින් 2022.10.11 වෙනි දිනැති ලිපිය මගින් අභියාචක වෙත දන්වා ඇත්තේ, එවකට නිකුත් කර තිබූ විනය නියෝගය සංශෝධනය කරමින් එය වැටුප් වර්ධක එකක් විලම්භනයක් බවට පත් කිරීමට තීරණය කර ඇති බවයි. මේ අනුව අභියාචකගේ ඉල්ලීම වන්නේ, එසේ විලම්භනය කර ඇති වැටුප් වර්ධකය නැවත ලබාදෙමින්, ඉහත කී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය ඉවත් කරන ලෙසයි.

අභියාචක වරදකරු බවට පත් කර ඇති ප්‍රථම චෝදනා තුන අතරින් පළමු චෝදනා දෙක සඳහා පදනම් ව ඇත්තේ, පිළිවෙලින් 2016.12.02 වෙනි දින සහ 2016.12.12 වෙනි යන දිනයන් හී රාත්‍රී 8.00ත්, 9.00ත් අතර කාලපරිච්ඡේදයන් තුළ සිදුවුනා යැයි කියන ලබන සිද්ධීන් දෙකක් මුල්කරගෙන ය. එම සිද්ධීන් දෙක සම්බන්ධයෙන් ඉදිරිපත් වූ සාක්ෂි විමසීමෙන් අනතුරුව එම චෝදනාවන්ට අභියාචක වරදකරු බවට තීරණය කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස චූදිතට එරෙහිව ඉදිරිපත් කර ඇති හතරවන චෝදනාව ලෙස සඳහන් කර ඇති අසත්‍ය වාර්තා ලබා දීම මගින් ආයතනයේ පැවැත්මට තර්ජනයක් මෙන්ම අපකීර්තියක් ද වන බවට යනුවෙන් සඳහන් කරමින් ඉදිරිපත් කර ඇති හතරවන චෝදනාවට ද වරදකරු බවට තීරණය කර ඇත. ඒ අනුව, 4 වන චෝදනාවේ නිරවද්‍යතාවය බැදී පවතින්නේ ප්‍රථම චෝදනා දෙක සම්බන්ධයෙන් ගනු ලබන තීරණයන් මතය.

ප්‍රථම චෝදනා දෙකෙන්ම ඉදිරිපත් කරන ලද කරුණු බොහෝ දුරට සමානවේ. ඒවා වෙනස් කර හඳුනා ගෙන ඇත්තේ, දින දෙකක දී, සිදුවූ අවස්ථා දෙකක් හේතුවෙනි. ඒ අවස්ථා දෙකේ දීම සිදුවුවායැයි කියනු ලබන සිද්ධීන් වන්නේ, පොලීසිය මගින් රථවාහන වරදක් සම්බන්ධයෙන් අත්

අඩංගුවට ගන්නා ලද පුද්ගලයින් දෙදෙනෙකු බීමත්ව සිටි බව තහවුරු කිරීම සම්බන්ධයෙන් වූ, "**මත්පැන් ගඳ වහනය නොවේය**" යනුවෙන් තීරණය කරමින් අභියාචක විසින් ඉදිරිපත් කරන ලද අධිකරණ වෛද්‍ය වාර්තාවන් දෙකයි.

2016.12.02 වන දින අභියාචක වෙත ඉදිරිපත් කරන ලද පුද්ගලයා එච්.බී.රවීන්ද්‍ර සම්පත් යන අය වන අතර, 2016.12.12 වෙනි දින ඉදිරිපත් කරන ලද පුද්ගලයා වන්නේ ජේ.ඒ.ප්‍රියන්ත නැමැති අයයි. චූදිතයින් දෙදෙනා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සම්පූර්ණ කරන ලද අංක 663/2016 සහ 697/2016 දරණ අධිකරණ පෝරම අභියාචක විසින් ඉදිරිපත් කර ඇත. ඉන් අනතුරුව ඉහත කී චූදිතයින් දෙදෙනා නැවත වරක් පිළිවෙලින් වෛද්‍ය එච්.කේ.එස්.කුමාරසිරි, සහ වෛද්‍ය ඩබ්.ඒ.විජේවර්ධන යන දෙදෙනා වෙත, දෙවන පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් කර ඇත. එකී වෛද්‍යවරුන් දෙදෙනා විසින්, චූදිතයින් දෙදෙනා සම්බන්ධයෙන් දෙවෙනි මතයක් ඉදිරිපත් කර ඇත. චූදිතයින් දෙදෙනා සම්බන්ධයෙන් අභියාචක විසින් ඉදිරිපත් කරන ලද නිගමනය වූයේ, ඔවුන් දෙදෙනා වෙතින් මත්පැන් ගඳ වහනය නොවන බවයි. අනික් වෛද්‍යවරුන් දෙදෙනා මෙම චූදිතයින් දෙදෙනා සම්බන්ධයෙන් ගනු ලැබ ඇති තීරණය වන්නේ, චූදිතයින් දෙදෙනා වෙතින්ම මත්පැන් ගඳ වහනය වන බවයි. මෙතෙක් සඳහන් කළ ඉහත කී සිද්ධිමය කරුණු සම්බන්ධයෙන් විවාදයක් පැන නොනගී.

මෙම තත්ත්වය යටතේ මෙහිදී තීරණය කළ යුතු වන්නේ අභියාචක විසින් රථ වාහන වැරදි සම්බන්ධයෙන් අත් අඩංගුවට ගන්නා ලද චූදිතයින් දෙදෙනෙකු වෙතින් මත්පැන් ගඳ වහනය නොවන බවට ප්‍රකාශ කර ඇති නිගමනයේ නිවරද්‍යතාවයයි. ඉදිරිපත් කරන ලද අභියාචනය සම්බන්ධයෙන් මෙම විනිශ්චය අධිකාරයේ පැවති පරීක්ෂණයේ දි, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති 2025.04.21 දිනැති ලිඛිත දේශන වල සඳහන් කර ඇත්තේ, චූදිතයින් දෙදෙනා පරීක්ෂා කරන ලද අභියාචක නොවන අනික් වෛද්‍යවරුන් දෙදෙනාගේ මතය අනුව, අභියාචක විසින් මත්පැන් ගඳ වහනය වීම සම්බන්ධයෙන් දී ඇති මතය වැරදි සහගත බවයි. ඊට අමතරව චෝදනා ලද චූදිතයින් දෙදෙනා, මහේස්ත්‍රාත් අධිකරණයේ දි වරද පිළිගෙන ඇති නිසා, මත්පැන් ගඳ වහනය වීම ඔවුන් විසින් පිළිගෙන ඇති බවය. ඒ අනුව අභියාචක විසින් වැරදි සහගත තීරණයකට එළඹ ඇති බවට විනය පරීක්ෂණයේ දි තීරණය වි ඇත. එයින්

පැහැදිලි වන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවන ලද දඬුවමට පදනම් වී ඇත්තේ,

i. එකම කරුණක් සම්බන්ධයෙන්, අභියාචක වෛද්‍යවරයා හැර වෙනත් වෛද්‍යවරුන් දෙදෙනෙකුගේ මතයන් පිළිගැනීම, සහ

ii. සිද්ධියට භාජනය වූ රථ වාහන වැරදි සම්බන්ධ පුද්ගලයින් දෙදෙනා අධිකරණයේ දි වරද පිළිගැනීමයි.

එබැවින් මෙම කරුණු දෙක වෙන් වෙන්ව සළකා බලමි. සිද්ධියට අදාළව එක් එක් මතයන් ඉදිරිපත් කර ඇති පුද්ගලයින් තිදෙනාම බොහෝ දුරට එක සමාන අධ්‍යාපන සුදුසුකම් දරණ වෛද්‍යවරුන්ය. ඉදිරිපත් වී ඇති සියළුම සාක්ෂි සහ පාර්ශවකරුවන් විසින් එක් එක් විධිමත් පරීක්ෂණයන්හිදි ඉදිරිපත් කර ඇති කරුණු අනුව පැහැදිලි වන්නේ, කිසියම් පුද්ගලයෙකු තුළින් මත්පැන් ගඳ වහනය වීම සම්බන්ධයෙන් **<u>නිවැරදි සහ පිළිගත හැකි තීරණයකට</u>** එළඹිය හැක්කේ, එක් එක් පුද්ගලයාගේ රුධිර පරීක්ෂණකින් අනතුරුව කරන ලද විද්‍යාත්මක පරීක්ෂණයකින් පසුව පමණක් වන බවයි. එවැනි රුධිර පරීක්ෂණයක් විද්‍යාත්මක වශයෙන් පවත්වා තිබීම, ඒ පිළිබඳ නිවැරදි තීරණයකට එළඹීම සඳහා අවශ්‍ය වෙනවා ඇත.

මෙහිදී එවැනි විද්‍යාත්මක පරීක්ෂණයක් කිසිදු වෛද්‍යවරයෙකු විසින් සිදුකර නැත. මෙහිදී සිදුවී ඇත්තේ වෛද්‍යවරුන් තිදෙනා සාමාන්‍ය පුද්ගලයින් ලෙස කටයුතු කරමින්, සැකකරුවන්ගේ භෞතික ස්වභාවයන් නිරීක්ෂණයට ලක්කරමින්, ගෙන ඇති තීරණයන් මත කටයුතු කර තිබීමය. ඒ අනුව වෛද්‍යවරුන් තිදෙනා ම ඔවුන්ගේ ඉන්ද්‍රියයන්ට දැනෙන අන්දමින් කටයුතු කරමින් පමණක් අදාළ තීරණයන්ට එළඹ ඇති බැව් පැහැදිලිය.

එක් එක් පුද්ගලයා ඔවුනොවුන්ගේ ඉන්ද්‍රියයන් අනුව එකම ආකාරයකට ක්‍රියාකර තිබිමක් බලාපොරොත්තු විය නොහැක. කිසියම් පුද්ගලයෙකු තවත් පුද්ගලයෙකු පරීක්ෂා කිරීමෙන් ගනු ලබන තීරණයන්, ඒ ඒ අවස්ථාවන් සම්බන්ධයෙන් ඉදිරිපත් වන කරුණු මත රඳාපවතී. කිසියම් පුද්ගලයෙකු ඉතාමත් අධික ලෙස වෙහෙසට පත්ව සිටින අවස්ථාවක දී, වෙනත් පුද්ගලයෙකු සම්බන්ධයෙන් ගනු ලබන තීරණයන්, එම පුද්ගලයා සාමාන්‍ය අන්දමට කටයුතු කරන අවස්ථාවකදි ගනු ලබන තීරණයට පටහැනි වන්නට පුළුවන. ඒ සමගම එක් එක් පුද්ගලයාගේ ඉන්ද්‍රියයන් ක්‍රියාත්මක වන්නේ ද වෙනස් ආකාරයන්ට ය. කිසියම් පුද්ගලයෙකු රෝගී තත්ත්වයෙන් සිටිමින් වෙනත් කිසියම් පුද්ගලයෙකු පරීක්ෂා කර ඇත්නම්, ඒ

මගින් ද පරීක්ෂණයට භාජනය වූ පුද්ගලයා සම්බන්ධයෙන් ගනු ලබන තීරණ, මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටින අයකු විසින් ගනු ලබන තීරණයකට වඩා වෙනස් වනවා ඇත. උදාහරණ වශයෙන් කිසියම් පුද්ගලයෙකු සෙම්ප්‍රතිශ්‍යාවෙන් පෙළෙන්නේ නම් ඔහුට නියමාකාරයෙන් ගඳ, සුවඳ දැන ගැනීමට හැකියාව ලැබෙන්නේ නැත.

මේ බව වඩාත් තහවුරු වන්නේ, ඉදිරිපත් කර ඇති තුන්වන චෝදනාව සම්බන්ධයෙනි. එම අවස්ථාවේ දී අත් අඩංගුවට ගත් සැකකරු පරීක්ෂා කරන ලද වෛද්‍ය ජීවන් ද සිල්වා සඳහන් කර ඇත්තේ, යම්කිසි තැනැත්තෙකු එක් වෛද්‍යවරයකු විසින් පරීක්ෂා කර තිබියදී, දෙවෙනි උපදෙසක් සඳහා ඔහු වෙත ඉදිරිපත් කර තිබුණේ නම්, එවැනි පුද්ගලයෙකු ඔහු විසින් කිසි විටක පරීක්ෂා නොකරන බවය. එවැනි අවස්ථාවක දී, ඔහු විසින් කරනු ලබන්නේ එම පුද්ගලයා විශේෂඥ වෛද්‍යවරයෙකු වෙත ඉදිරිපත් කරන බවයි. ඔහු තවදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, එක් පුද්ගලයෙකු එකම දිනයක බීමත්කම සම්බන්ධයෙන් එක හා සමාන සුදුසුකම් ඇති වෛද්‍යවරුන් දෙදෙනෙකු වෙත ඉදිරිපත් කිරීම දෝෂ සහගත බවයි. තවදුරටත් ඔහු ප්‍රකාශ කර ඇත්තේ බිමත් සැකකරුවන් පරීක්ෂා කිරීම සඳහා වෛද්‍යවරු වෙත ඉදිරිපත් කිරීමේ දී, එක් එක් වෛද්‍යවරු විසින් සායනික කරුණු මත පමණක් පදනම්ව ගනු ලබන තීරණ වලදී එකම පුද්ගලයා සම්බන්ධයෙන් වුවද, එම පුද්ගලයා සම්බන්ධයෙන් එකම අවස්ථාවකදී පවා සැළකිය යුතු වෙනස්කම් තිබිය හැකි බවයි.

එම සාක්ෂියෙන් පැහැදිලිව පෙනී යන්නේ, වෛද්‍යවරුන් දෙදෙනෙකු වෙත, එකම පුද්ගලයෙකු, අවස්ථා දෙකකදී ඉදිරිපත් කිරීම හේතුවෙන් සහ එක් එක් වෛද්‍යවරයාගේ දැනුමට භාජනය වන එක් එක් කරුණු මත, සායනික පරීක්ෂණයකින් දෙනු ලබන තීරණයන් වෙනස් විය හැකි බවයි. එයින් පැහැදිලිව වන්නේ, විශේෂඥ දැනුමක් අවශ්‍ය කරුණක් සම්බන්ධයෙන්, දෙවන මතයක් ප්‍රකාශ කරන්නේ නම්, එය කළ හැකි වන්නේ විද්‍යාත්මකව කරනු ලබන විධිමත් පරීක්ෂණයකින් පසුව බවයි.

මෙහිදී සඳහන් කළ යුතු තවත් වැදගත් කරුණක් වන්නේ, ඉහත කී වෛද්‍ය ජීවන් ද සිල්වා යන අය සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇති කරුණුය. ඔහු පවසා ඇත්තේ පොලිසිය විසින් මෙම සැකකරු ඉදිරිපත් කරන අවස්ථාවේ දී, ඔහු වෙත ඉදිරිපත් කරන ලද අධිකරණ පෝරමයේ

සැකකරුගේ හැඳුනුම්පත් අංකය හෝ සැකකරුගේ අත්සන නොතිබූ බවයි. ඒ හේතුවෙන් සැකකරුගේ අනන්‍යතාවය තහවුරු කරගෙන නොමැති නිසා, ඒ මගින් පොලීසිය මත විශ්වාසය තබා කටයුතු කිරීම අවධානම් කටයුත්තක් වන බවටත් ඔවුන් ප්‍රකාශ කර ඇත. එසේ අනන්‍යතාවය ස්ථිර කර ගැනීමක් නොමැතිව, සැකකරුවකු සම්බන්ධයෙන් මතයක් ඉදිරිපත් කළහොත්, ඒ මතය ඉදිරිපත් වන්නේ ස්ථිර වශයෙන් ම වරද සිදුකළ පුද්ගලයා සම්බන්ධයෙන්මද යන්න සැකයට භාජනය වන බවට ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. එවැනි සාක්ෂි කිසිසේත් ම ප්‍රතික්ෂේප කළ නොහැක.

මෙහිදී සළකා බැලිය යුතු තවත් සාක්ෂියක් වන්නේ ධම්මි ලුවිස්හේවා යන වෛද්‍යවරියගේ සාක්ෂියයි. ඇය 2019.05.15 වෙනි දිනෙන් ආරම්භ වී සාක්ෂි දෙන අවස්ථාව දක්වා, තංගල්ල මූලික රෝහලේ අධිකරණ වෛද්‍ය හා විෂවේද විශේෂඥ වෛද්‍යවරියක වශයෙන් සේවය කළ බවට ඇය සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත. ඇය සඳහන් කර සඳහන් කර ඇත්තේ, "**මත්පැන්**" අයත් වන්නේ විෂ ගණයකට බවයි. විෂ මත්පැන් වල ඇත්තේ ද, විවිධාකාරයේ ඇල්කොහොල් බවට ඇය ප්‍රකාශ කර ඇත. මත්පැන් බී රිය පැදවීම සම්බන්ධයෙන් දීර්ඝ විස්තරයක් ද, ඇය විසින් ප්‍රකාශ කර ඇත. එකී  කරුණු වලට අමතරව, මෝටර් රථ ආඥා පනත යටතේ විධි විධාන වලටද අවධානය යොමු කරමින් ඇය සාක්ෂි ඉදිරිපත් කර ඇත. ඇයගෙන් අසන ලද ප්‍රශ්නයක් වන

> "**එකම පුද්ගලයෙක් මධ්‍යසාර ගඳ සඳහා වෛද්‍යවරු කිහිපදෙනෙකුගේ මත සඳහා ඉදිරිපත් කිරීමේ දී සෑම විටම එකම ප්‍රතිඵල අපේක්ෂා කළ හැකිද ?**"

යන ප්‍රශ්නයට ඇය පිළිතුරු දී ඇත්තේ, "**කිසිසේත්ම නැත**" යනුවෙනි. එම පිළිතුර ලබා දී, ඉන් අනතුරුව එසේ පිළිතුරු ලබාදීමට හේතුව ද ඇය දීර්ඝ වශයෙන් විස්තර කර ඇත.

ඇයගේ සුදුසුකම් හා ඉදිරිපත් කර ඇති සාක්ෂි පරීක්ෂා කර බැලීමේ දී පෙනී යන්නේ, එකී විශේෂඥ වෛද්‍ය ධම්මි ලුවිස්හේවා මහත්මිය මේ සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් ඇති තැනැත්තියක බවයි. එවැනි විශේෂඥවරියකගේ සාක්ෂි ප්‍රතික්ෂේප කළ නොහැක. එයට විරුද්ධ මතයක් වෙනත් විශේෂඥ වෛද්‍යවරයෙකු විසින් හෝ ඉදිරිපත් කර නොමැත.

විනය පරීක්ෂණයේ දී පැමිණිලි පාර්ශවය වෙනුවෙන් පවසා ඇත්තේ, විශේෂඥ වෛද්‍යවරිය අභියාචක සේවය කරන ප්‍රදේශය තුළ සේවය කරමින් එකම වෘත්තියේ යෙදෙන කෙනෙකු නිසා එම සාක්ෂිය පිළිගත නොහැකි බවයි. ඇයගේ සාක්ෂිය දෙස බැලීමේ දී පෙනී යන්නේ, ඇය විසින් එම සාක්ෂිය, විද්‍යාත්මක පදනමක් මත විශේෂඥ දැනුම උපයෝගී කරගනිමින් ඉදිරිපත් කර ඇති බවයි. මෙහිදී ඇය අභියාචකට පක්ෂග්‍රාහීව සාක්ෂි දෙන බවක් හැඟී යන්නේ නැත. කෙසේ වෙතත් එවැනි විශේෂඥ සාක්ෂියක් පැමිණිල්ලේ කරුණු මත ප්‍රතික්ෂේප කරන්නේ නම්, එය උචිත ක්‍රියාවක් නොවේ.

මෙම තත්ත්වය යටතේ, විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා එම සාක්ෂිය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර තිබිය යුතුය. මේ සම්බන්ධයෙන් පරීක්ෂණ නිලධාරියාගේ වාර්තාවෙහි ඔහු විසින් සඳහන් කර ඇත්තේ, මෝටර් රථ ආඥා පනත යටතේ දඩුවම් කළ නොහැකි බවට ද, ඇය කියා ඇති සාක්ෂිය තහවුරු කිරීමට සාධක නොලැබුණ බවයි. එවැනි හේතුවක් කුමන අන්දමකට සාධාරණීය කළ හැකිද යන්න ප්‍රශ්නයට භාජනය වේ. ඒ හැරෙන්නට පරීක්ෂණ නිලධාරියා සඳහන් කර ඇත්තේ, තම කාර්ය මණ්ඩලයේ සහායක වෛද්‍යවරයෙකු වෙනුවෙන් ලබා දී ඇති සාක්ෂිය, කමිටුව ඉදිරියේ ඉදිරිපත් වූ සාක්ෂි වලින් තහවුරු නොවන බවයි. එසේ නම් ඔහු ක්‍රියා කර ඇත්තේ, විශේෂඥ සාක්ෂි නොසළකා හරිමින්, කිසියම් කමිටුවක වාර්තාවක් පිළිගැනීමයි. එය සම්පූර්ණයෙන් ම වැරදි සහගතය.

ඉහත සඳහන් හේතූන් අනුව අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති ප්‍රථම චෝදනා දෙක සම්බන්ධයෙන් පරීක්ෂණ නිලධාරියා ගෙන ඇති තීරණය පදනම් විරහිත සහ පිළිගත නොහැකි හේතූන් මත ගෙන ඇති බවට පැහැදිලි වේ. එසේ නම් පරීක්ෂණ නිලධාරියා විසින් අභියාචකට එරෙහිව තිබූ ප්‍රථම චෝදනා දෙකට වැරදිකරු කරමින් ගෙන ඇති තීරණය ඉවත් කළ යුතුවේ. අභියාචක වරදකරු කර ඇති හතරවන චෝදනාව පදනම් ව ඇත්තේ, ඉහත කී ප්‍රථම චෝදනා දෙක මතය. එම චෝදනා දෙකට අභියාචක වැරදිකරු නොවිය යුතු බවට ඉහතින් තීරණය කර ඇති නිසා, හතරවන චෝදනාවට අභියාචක වරදකරු කිරීමට හැකියාවක් ලැබෙන්නේ නැත.

ඉහත හේතූන් සළකා බලා, විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ පරීක්ෂණ නිලධාරියා විසින් අභියාචකට එරෙහිව ඉදිරිපත් කර ඇති 1, 2 සහ 4 වන චෝදනා වලට වරදකරු බවට පත්කරමින් ගෙන ඇති තීරණය ඒ ආකාරයෙන් පවත්වා ගෙන යාමට හැකියාවක් ලැබෙන්නේ නැත. එසේ නම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අභියාචක සම්බන්ධයෙන් නිකුත් කර ඇති දඩුවම මත තීරණය මත ලබා දී ඇති නිසා, එකී දඩුවම ද ඉවත් කළ යුතුය. එබැවින් අභියාචක සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.10.12 දිනැති ලේඛනයේ සඳහන් කර ඇති අභියාචකගේ වැටුප් වර්ධකයක් විලම්භනය කිරීමට ගෙන ඇති තීරණය ඉවත් කිරීමට තීරණය කරමු.

ඒ අනුව සුදුසු පියවර ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වැඩිදුරටත් නියෝග කරමු.

ඉහත කරුණු සළකා බලා අභියාචක ඉදිරිපත් කර ඇති අභියාචනයට ඉඩදෙමු.

අභියාචනයට ඉඩදෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි

(සභාපති)

මම එකඟ වෙමි.

(ජේ.ජේ.රත්නසිරි)
(සාමාජික)

මම එකඟ වෙමි

(එස්.නන්දසේකරන්)
(සාමාජික)

ලලිතා/-